ආගරපතන ප්‍රාදේශීය සභාව - 2021

----------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ආගරපතන ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ආගරපතන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (I) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයතනයක වර්ෂය තුළ සිදුවන සියලුම ගණුදෙනු හා සිද්ධිවල ශේෂයන් හා වත්කම් වගකීම් ශේෂයන් දක්වා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂ පිරික්සුම පිළියෙල කළ යුතු වුවත් ,සභාව විසින් වත්කම් වගකීම් ශේෂ පමණක් ඇතුළත් කොට ශේෂ පිරික්සුම පිළියෙල කර තිබුණි. | අඩුපාඩුව පිළිගන්නා අතර, මෙම වර්ෂයේ සිට ශේෂ පිරික්සුම නිවැරදි ලෙස සකස් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | ශේෂ පිරික්සුම නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලී බඩු හා සවි කිරීම් ශේෂය රු.2,470,399 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල සඳහන් වත්කම් විෂයයන් 14 ක් තුළ ඇතුළත් ඒකක 45 ක වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | අඩුපාඩුව පිළිගන්නා අතර, ලී බඩු හා සවිකිරීම් ඉදිරියේදී හඳුනාගෙන ගිණුම් සඳහා ඇතුලත් කර ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | වත්කම්වල අගයන් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | 2018 වර්ෂයේදී නෝර්වුඩ් ප්‍රාදේශීය සභාවට නිකුත් කර තිබුණු ආයුර්වේද තොගයේ වටිනාකම රු.240,000 ක මුදල සභාවට අයකරගෙන නොතිබුණු අතර එය මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු මුදලක් ලෙසටද දක්වා නොතිබුණි. | ඉදිරියේදී අය කර ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. | ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර මූල්‍ය ප්‍රකාශනවලද දැක්විය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | මූල්‍ය ප්‍රකාශනයේ රු.4,514,359 ක වත්කම්ද, රු.495,313 ක වගකීම්ද, ලෙස අවස්ථා 02 කදී එකතුව රු.5,009,672 ක් අඩුවෙන් දැක්වීමද, ආදායම් රු.77,800 ක්, වියදම් රු.24,138 ක් හා රු.111,493 ක වගකීම් ලෙස, අවස්ථා 04 කදී එකතුව රු.213,431 ක් වැඩියෙන් දැක්වීමද, පැවතුණි. | 2022 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කරන බව දන්වා ඇත. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |

**1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31දිනට පිළියෙල කරන ලද ශේෂ පත්‍රය හා අදාළ උපලේඛනවලට අනුව ගිණුම් විෂයන් 04 ක රු.808,863 ක වෙනසක් පැවතුණි. | අඩුපාඩු පිළිගන්නා බව දන්වා ඇත. | ගිණුම් ශේෂවල වෙනස්කම් සම්බන්ධයෙන් සොයා බලා අදාළ උපලේඛන හෝ මූල්‍ය ප්‍රකාශන නිවැරදි කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,579,585 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.6,099 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් හා බදු | | |
| | ප්‍රාදේශීය සභා පනතේ (1) 158 වගන්තිය ප්‍රකාරව දෙවන කාර්තුව අවසානයට හිඟ හිටුවා ඇති දේපළ පිළිබඳ ලැයිස්තු සකස් කර දින 14 ක් ඇතුළත බදු ගෙවන ලෙසට දැන්වීම් සිදුකළ යුතු නමුත්, එසේ නොකළ ප්‍රදේශ 19 කින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වනවිට රු.1,191,230 ක වරිපනම් බදු අයකර නොතිබුණි. | අදාළ දේපළ අයිතිකරුවන් වෙත වරිපනම් නොගෙවීම සම්බන්ධව දේපළ තහනම් කිරීමේ නිවේදන යොමු කිරීමට කටයුතු යොදා ඇති බව දන්වා ඇත. | හිඟ ආදායම් අයකළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 වත්කම් කළමනාකරණය

------------------------------

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මෙරායා ආයුර්වේදය හා පුස්තකාලය පිහිටි ඉඩමේ ඉදිරිපස කොටස බාහිර පාර්ශවයක් විසින් අත්පත් කරගෙන තිබුණු අතර ,නිළධාරීන් නොමැතිවීම හේතුවෙන් සමාලෝචිත දෙසැම්බර් 31 දින දක්වා පුස්තකාලය විවෘත කිරීමට නොහැකිව පැවතුණි. පුස්තකාල ගොඩනැගිල්ලේ කාමර දෙකක් ආයුර්වේද වෛද්‍යවරයාගේ සහ මහජන සෞඛ්‍ය පරීක්ෂකගේ පරිහරණයට යොදා ගෙන තිබුණු බැවින් මහජන පුස්තකාලයෙන් ඉටුවිය යුතු සේවාව ප්‍රදේශවාසීන්ට ලැබී නොතිබුණි. එමෙන්ම පුස්තකාලය සතු විශාල පොත් තොගයක් සහ උපකරණ තොගයක් ප්‍රයෝජනයකට නොගෙන නිෂ්කාර්යයව පැවතුණි. | හැකි ඉක්මනින් අදාළ ඉඩම මැනුම් කර සභාව සතු භූමි ප්‍රමාණය හඳුනා ගෙන ප්‍රකාශන ඔප්පු සකස් කරගැනීමට කටයුතු කරන අතර ඉන් පසු අදාළ දේපළ සම්බන්ධයෙන් බාහිර පාර්ශව විසින් අනවසර අත්පත් කරගැනීම් සිදු කර ඇති නම් ඒ සම්බන්ධයෙන් නිසි නීතිමය ක්‍රියාමාර්ග ගන්නා බව දන්වා ඇත. | සභාව සතු වත්කම් සඳහා ඔප්පු සකස් කර සහා දේපල ආරක්ෂා කිරීමට කටයුතු කළ යුතුය. එමෙන්ම පුස්තකාලය සහ ආයුර්වේද මධ්‍යස්ථානය පවත්වාගෙන යා යුතුය. |
| (ආ) | 2020 සැප්තැම්බර් 05 දින අනතුරකට ලක්වී තිබුණු ටොයොටා ලැන්ඩ් ක්‍රෑෂර් රථය අළුත්වැඩියා නොකර විගණිත දින වූ 2022 ජනවාරි 31 දින වන විට වසර 01මාස 03 කට ආසන්න කාලයක් ගත වී තිබුණි. එම රථය අළුත්වැඩියා කටයුතු සඳහා පෞද්ගලික ගරාජයකට යොමුකර සභාපතිවරයාගේ ගමන් සඳහා කුලී රථයක් යොදාගෙන සමාලෝචිත වර්ෂයේදී රු 1,456,000.ක කුලී ගෙවා තිබුණි. | වාහනය අළුත්වැඩියා කිරීම සඳහා ඇස්තමේන්තුවක් කැඳවීමට කටයුතු කළ බව දන්වා ඇත. | නොපමාව වාහනය අලුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතුය. |

**4.** **ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1** **පාරිසරික ගැටලු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාව ආරම්භ කර වසර 05 ක කාලයක් ගත වී තිබුණද, කසළ බැහැර කිරීම සඳහා සුදුසු ඉඩමක් තෝරා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර 2021 වර්ෂයේදී දිරන කසළ මෙට්‍රික් ටොන් 104 ක් තලවාකැලේ නගර සභාවේ කසළ අංගනයට රැගෙන ගොස් තිබුණි. එමෙන්ම නොදිරන කසළ ටොන් 02 ක් භූමි පිරවීම් ලෙස සඳහා භාවිතා කර තිබුණි. කසළ කළමනාකරණය සඳහා වැටුප් හා අතිකාල ලෙස සේවකයින් 07 දෙනෙකු සඳහා රු.5,606,746 ක් වැය කර තිබුණු අතර කසළ ප්‍රවාහනය කළ ට්‍රැක්ටර් රථය සඳහා ඉන්ධන හා අළුත්වැඩියා වියදම් ලෙස රු.229,100 ක්ද වැයකර තිබුණි. | ඉදිරියේදී පළාත් පාලන ආයතනය වෙත ස්ථිර ලෙස සුදුසු කසළ අංගනයක් ලබා ගැනීමට අපේක්ෂා කරන බවත්, ඉන් පසු නිසි වැඩපිළිවෙළකට හා සැලසුමකට අනුව කසළ රැස් කිරීමටත් බැහැර කිරීමටත් කටයුතු කරන බවත් දන්වා ඇත. | කසළ කළමනාකරණය විධිමත් පරිදි සිදුකළ යුතුය. |